**SAVINGS**

AIA SAVINGS PLUS GOLD

# ඔබේ සිතේ සැනසුම හා සෞභාග්‍යය සුරක්ෂිතයි



aialife.com.lk

HEALTHIER, LONGER, BETTER LIVES

අප සතුව අනාගතය පිළිබඳ බොහෝ අපේක්ෂාවන් පවතින අතර, එම අපේක්ෂාවන් යථාර්තයක් බවට පත්කර ගැනීමේ අරමුණින් අපි ඉතිරි කිරීමේ යෙදෙන්නෙමු. හඳුන්වාදෙන AIA SavingsPlusGold සැලසුම මගින් ඔබ සහ ඔබගේ ආදරණීයයන් ආරක්‍ෂා කරන්නාවූ පරිපූර්ණ රක්‍ෂණ ප්‍රතිලාභ රැසක් ඔබ වෙත පිරිනැමේ.

දැන් ඔබට, ඔබේ පවුලේ අනාගතය වෙනුවෙන් ඉතිරි කළ හැකි අතරම බරපතල රෝගාබාධ, රෝහල්ගතවීම්, සැත්කම් ආදී අමතර රක්‍ෂණ ප්‍රතිලාභ රැසක්ද මෙම සැලසුම මගින් ලබාදෙයි.

# AIA SavingsPlusGold හි විශේෂත්වයන්

- ඔබටම ගැළපෙන ජීවිතාවරණයක්.
- ඔබ, ඔබගේ කලත්‍රයා හා ඔබගේ දරුවන් සඳහා බරපතල රෝගාබාධ, රෝහල් ගතවීමේ සහ සැත්කම් සඳහා වන ආවරණ ඇතුළු අමතර සෞඛ්‍ය හා රැකවරණ ප්‍රතිලාභ රැසක්.
- වාර්ෂිකව සහතික කළ ලාභාංශ අනුපාතයක්.
- ඔබේ ඉතුරුම්, උද්ධමනයේ අහිතකර බලපෑමෙන් සුරක්‍ෂිත කිරීමේ හැකියාව.
- අමතර වාරික (Top-ups) මගින් ඔබේ ඉතුරුම් අරමුදල තව දුරටත් වර්ධනය කිරීමේ අවස්ථාව.
- සැලසුම් වසර 3ක් වාරික ගෙවා සම්පූර්ණ වූ පසු වාරික ගෙවන කාල සීමාව තුළදී, එක්වරක්, අරමුදලේ වටිනාකමින් 15%ක උපරිමයක් දක්වා මුදල් ආපසු ලබාගැනීමේ හැකියාව.
- ඔබගේ පවුලේ මාසික ආදායම සුරක්‍ෂිත කිරීමේ හැකියාව.

# AIA SavingsPlusGold සැලසුම සමග පිරිනැමෙන ලාභාංශ

AIA SavingsPlusGold සැලසුම සමග පිරිනැමෙන සුවිශේෂී ලාභාංශ ක්‍රමය තුළින් ඔබට ලබාදෙන වාර්ෂික ලාභාංශ, ඔබේ අරමුදලේ අගය වසරක් පාසා ඉහළ නංවයි. මෙහිදී ඔබේ අරමුදල වසරක් පාසා වර්ධනය වන්නේ එම වසරට අදාළ සහතික කළ ලාභාංශ අනුපාතය (ගාස්තු අඩු කිරීමෙන් පසු) හෝ ප්‍රකාශිත ලාභාංශ අනුපාතය (ගාස්තු අඩු කිරීමෙන් පසු) යන දෙකෙන් වැඩි අගයෙනි.

ගෙවනු ලබන වාරිකයෙන් ආයෝජනය වන ප්‍රතිශතයට අදාළ මුදල, ගාස්තු අඩු කිරීමෙන් පසු (උදාහරණ: ජීවිතාවරණයට අදාළ ගාස්තු, රක්‍ෂණ පරිපාලන ගාස්තු) රක්‍ෂණවරහිමියාගේ අදාළ ආයෝජන ගිණුමට බැර කෙරේ. ඒ අනුව ආයෝජන ගිණුමේ ඇති මුදල අදාළ ලාභාංශ ප්‍රතිශතයන් යටතේ වැල්පොලී ක්‍රමයට වර්ධනය වනු ඇත.

# ඔබටම ගැළපෙන ජීවිතාවරණයක්

AIA SavingsPlusGold මගින් ඔබගේ අවශ්‍යතාවයට අනුව ඔබටම සරිලන ජීවිතාවරණයක් සකස්කර ගත හැක.

# Loyalty දීමනාව

10වැනි සැලසුම් සංවත්සරයේදී ඔබ වෙත ඔබගේ වාර්ෂික මූලික වාරිකය මෙන් 350% දක්වා Loyalty දීමනාව හිමිවනු ඇත. මෙම දීමනාව හිමිකර ගැනීමටනම්, ඔබ විසින් එම වසර 10 තුළ අදාළ වාරික ගෙවීමට නියමිත දිනයේ සිට දින 180ක් තුළ සියලු වාරික ගෙවීම් අඛණ්ඩව සිදු කළ යුතු වේ. ඔබගේ වාරික ගෙවීම් මාදිලිය අනුව (එනම්, අර්ධ වාර්ෂික, ත්‍රෛමාසික හෝ මාසික යනා දී වශයෙන්) Loyalty දීමනාව වෙනස් වනු ඇත.

# ඔබගේ ඉතුරුම් අරමුදල වර්ධනය වන ආකාරය

ඔබේ වයස අවුරුදු 30ක් නම්, 2017 දී AIA SavingsPlusGold සැලසුමක් රුපියල් 50,000ක හෝ 100,000ක වාර්ෂික මූලික වාරිකයකට සහ ජීවිතාවරණය වාර්ෂික මූලික වාරිකය මෙන් 15 ගුණයක් වන සේ ලබාගත්තේ නම් අවුරුදු 15කට පසු ඔබගේ කල්පිරීමේ ප්‍රතිලාභය සඳහා වන නිදර්ශනය පහත දැක්වේ.

| වාර්ෂික මූලික වාරිකය | ප්‍රක්ෂේපිත ඉතුරුම් අරමුදල | | |
|---|---|---|---|
| | 4% වාර්ෂික | 8% වාර්ෂික | 12% වාර්ෂික |
| 50,000 | 1,415,164 | 1,845,706 | 2,430,992 |
| 100,000 | 2,840,890 | 3,705,330 | 4,880,527 |

ශ්‍රී.ල.රු

ඉහත ප්‍රක්ෂේපිත කල්පිරීමේ වටිනාකම් ගණනයකර ඇත්තේ සැලසුමේ උද්ධමන ආරක්ෂණ ප්‍රතිශතය 5%ක් වන බවත්, 4%, 8% සහ 12% යන ලාභාංශ අනුපාතයන් යටතේ අරමුදල වර්ධනය වන බවත් (සැලසුමට අදාළ ගාස්තු අඩුකිරීමෙන් පසු) උපකල්පනය කරමිනි.

මෙහි දක්වා ඇති ලාභාංශ අනුපාතයන් සහතික නොකෙරේ. එමෙන්ම මෙම අනුපාතයන් ඔබට ලැබිය හැකි ඉහළම හෝ පහළම අනුපාතයන් ද නොවේ.

කල්පිරීමේදී ඔබට ලැබෙනුයේ ඔබේ අරමුදලෙහි වටිනාකම වේ. කල්පිරීමේදී ජීවිතාවරණය අවසන් වුවද, කල්පිරීමේ දිනට අනතුරුවද ඉතුරුම් අරමුදල පවත්වාගෙන යාමේ හැකියාව ඔබට ඇත.

# ඔබගේ සැලසුම යටතේ හිමි වන නම්‍යශීලීත්වයන්

## උද්ධමන ආරක්ෂණය

උද්ධමන ආරක්ෂණය, ඔබගේ ඉතුරුම් අරමුදලේ වටිනාකම උද්ධමනයේ අහිතකර බලපෑමෙන් සුරක්ෂිත කරනු පිණිස සකසා ඇත.

උද්ධමන ආරක්ෂණ ප්‍රතිශතය 0%, 5%, 10% හෝ 15%ක් ලෙස තෝරාගෙනයාමේ අවස්ථාවද ඔබ වෙත හිමිවේ.

ඔබගේ වාර්ෂික මූලික වාරිකය සෑම සැලසුම් සංවත්සරයකදීම තෝරාගෙන ඇති උද්ධමන ආරක්ෂණ ප්‍රතිශතයට අනුකූලව ඉහළ යනු ඇති අතර, වාරික ආරක්ෂණ ප්‍රතිලාභයට අදාල වාරිකයද (ප්‍රතිලාභය ලබාගෙන ඇත්නම්) ඒ අනුව ඉහළ යනු ඇත.

## අමතර වාරික (Top-ups)

වාරික ගෙවීමේ කාල සීමාව තුළ සැලසුමේ නියමිත වාරිකවලට අමතරව, 'අමතර වාරික' ගෙවමින් ඔබගේ ඉතුරුම් අරමුදල වැඩි කරගැනීමේ අවස්ථාව ඔබට හිමිවේ. 'අමතර වාරික' ඕනෑම විටකදී ගෙවිය හැකි වන අතර එක් 'අමතර වාරිකයක' වටිනාකම රුපියල් 10,000කට නොඅඩු විය යුතුය.

# අනපේක්ෂිත වියෝවකදී...

අනපේක්ෂිත වියෝවකදී ඔබගේ ආදරණීයයන් වෙත ජීවිතාවරණය හෝ අරමුදලේ වටිනාකම යන දෙකෙන් ඉහළ අගය සමග තෝරාගත් අදාළ අමතර රක්ෂණාවරණ ප්‍රතිලාභද ලැබෙනු ඇත.

# සැලසුමට සම්බන්ධ අනෙකුත් තොරතුරු

- ඇතුළත්වීමේ වයසඃ (ඊළඟ උපන් දිනයට) අවුරුදු 19-60 දක්වා. කල්පිරීමේ වයස අවුරුදු 75 නොඉක්මවිය යුතුය.
- සැලසුම් කාල සීමාවඃ අවුරුදු 10-30
- අවම ජීවිතාවරණයඃ රුපියල් 150,000
- ඔබගේ වාරිකය මාසිකව, ත්‍රෛමාසිකව, අර්ධ වාර්ෂිකව හෝ වාර්ෂිකව ගෙවිය හැක.

## අදාළ ගාස්තු

**වෙන්කිරීමේ ගාස්තුවඃ**

| සැලසුම් වසර | 1 සැලසුම් වසර | 2 සැලසුම් වසර | 3 වැනි සැලසුම් වසරේ සිට |
|---|---|---|---|
| මූලික වාරිකය මත | 70% | 55% | 0% |
| අමතර වාරික (Top-up) මත | 4% (සෑම අමතර වාරිකයක් මත) | | |

**පවාරන ගාස්තුව**

| සැලසුම් වසර | 1 සැලසුම් වසර | 2 සැලසුම් වසර | 3 සැලසුම් වසර | 4 වන සැලසුම් වසරේ සිට |
|---|---|---|---|---|
| පවාරණ ගාස්තුව | 100% | | | 75% සිට 0%* |

* සැලසුම් කාල සීමාව තුළ ක්‍රම ක්‍රමයෙන් පහළ යයි.

**සැලසුම් පරිපාලන ගාස්තුව**

2017 සඳහා වසරකට රුපියල් 265.74 ක් වන අතර සෑම ජනවාරි පළමුවැනි දිනකදීම වාර්ෂිකව 10% බැගින් ඉහළ යයි.

**අරමුදල් කළමනාකරණ ගාස්තුව**

ආයෝජන ගිණුමෙන් වාර්ෂිකව 0.75% කි.

**මර්තයතා ගාස්තුව**

සමාගම විසින් රක්ෂණයේ අවධානමට ලක්වන මුදල ලබා දීම සඳහා වන වියදමට අදාල අයකිරීම් මත පදනම් වේ.

**මාදිලි ගාස්තුව**

මාසික වාරික මාදිලිය, මූලික වාරිකයෙන් 4% කි.

# සැලසුම බලරහිත වුවහොත් සිදුවන්නේ කුමක්ද?

පළමු සැලසුම් වසර තුන ඇතුළත ඔබ විසින් ඔබගේ වාරික දින 30 ක සහන කාල සීමාව තුළ නියමිත පරිදි ගෙවනු නොලැබූ විටකදී, සැලසුම බලරහිත වන අතර ඔබ වෙත කිසිදු ප්‍රතිලාභයක් හිමිනොවනු ඇත. කෙසේවුවද සැලසුමේ කොන්දේසිවලට යටත්ව සැලසුම නැවත බලගැන්වීමේ අවස්ථාව ඔබට හිමිවේ.

ඔබ විසින් වසර තුනක් හෝ එයට වැඩි කාලයක් වාරික නිසි පරිදි ගෙවමින් සැලසුම පවත්වාගෙන ගොස් ඇත්නම්, අත්‍යවශ්‍ය අවස්ථාවකදී සැලසුම මුදල් බවට පත්කර ගැනීමේ හැකියාව ඔබට හිමිවේ. කෙසේ වුවද මෙහිදී සැලසුම සැලකිය යුතු පවාරණ ගාස්තුවකට යටත්වන අතර, එම ගාස්තු සැලසුම පවත්වාගෙන ගොස් ඇති කාල සීමාවත් සමග ක්‍රමානුකූලව අඩු වනු ඇත.

විකල්පයක් වශයෙන් ජීවිතාවරණ ප්‍රතිලාභය රහිතව ඔබේ අරමුදල වර්ධනය වීමට ඉඩ හරිමින් කල්පිරීමේ වටිනාකමක් ලබා ගැනීමටද ඔබට හැකි වේ.

# අමතර ප්‍රතිලාභ

## හදිසි අනතුරු ප්‍රතිලාභය

හදිසි අනතුරකින් සිදුවන වියෝවකදී ඔබේ යැපෙන්නන් හට මෙයින් වැඩි රැකවරණයක් හිමිවේ. එයට අමතරව ඔබට පූර්ණ නිත්‍ය අකර්මන්‍යතාවයකට මුහුණ දීමට සිදුවුවහොත් මූල්‍යමය රැකවරණය මෙයින් සැලසෙනු ඇත. (සැලසෙන මූල්‍ය ප්‍රතිලාභයේ වටිනාකම අකර්මන්‍යතාවයේ ස්වභාවය මත රඳා පවතී).

## රෝහල්ගතවීමේ ප්‍රතිලාභය

ඔබ දින තුනකට වඩා රෝහල්ගතව සිටියේනම්, සෑම දිනකටම (ඇතුළත් කළ දිනයේ සිටම) රුපියල් 10,000 ක උපරිමයක් දක්වා මුදල් ලබාදෙයි. දැඩි සත්කාර ඒකකයට ඇතුළත් කළහොත් ලැබෙන එම මුදල දෙගුණවේ. මෙම ප්‍රතිලාභය ඔබේ කලත්‍රයා හා දරුවන් වෙනුවෙන්ද ලබාගත හැක.

## රෝහල් ගාස්තු ආවරණය

ඔබ සහ ඔබේ පවුලේ සාමාජිකයන් වෙත ශ්‍රී ලංකාව තුළ වැය වන වෛද්‍යමය වියදම් නැවත පියවාගත හැකි සෞඛ්‍යාරක්ෂණ ආවරණයකි. (මෙම ප්‍රතිලාභය වාරික ආරක්ෂණ ප්‍රතිලාභය මඟින් ආවරණය නොවේ).

## වැඩිහිටි සැත්කම් ප්‍රතිලාභය

ඔබ හා ඔබේ කලත්‍රයා වෙත ශ්‍රී ලංකාවේදී, ඉන්දියාවේදී හෝ සිංගප්පූරුවේදී ලැයිස්තුගත සැත්කම් 250 ක් සිදුකිරීම සඳහා මෙමගින් මූල්‍ය සහය හිමි වේ.

## වාරික ආරක්ෂණ ප්‍රතිලාභය

පූර්ණ නිත්‍ය අකර්මන්‍යතාවයකට පත්වුවහොත්, ඉතිරි වාර මුදල් තැන්පත් කිරීමේ වගකීමෙන් ඔබ නිදහස්. එහෙත් පොරොන්දු වූ ප්‍රතිලාභ ඒ අයුරින්ම දිගටම ක්‍රියාත්මකයි.

## බරපතල රෝග ආවරණය

සැලසුමේ නිර්වචනය කළ පරිදි, බරපතල රෝගාබාධ 22 කදී ඔබට හා ඔබගේ කලත්‍රයාට මූල්‍යමය ආධාර ලබාදෙයි. රුපියල් මිලියන 3 ක උපරිමයක් දක්වා වූ ආවරණයක් ඔබට තෝරාගත හැකියි.

## ආදායම් ආරක්ෂණ ප්‍රතිලාභය

අනපේක්ෂිත අයුරින් ඔබගේ වියෝවකදී හෝ පූර්ණ නිත්‍ය අකර්මන්‍යතාවයකදී ඔබේ යැපෙන්නන් හට වාරික ගෙවීමේ කාල සීමාව තුළදී වසර 10 ක උපරිමයකට යටත්ව මාසික ආදායමක් හිමිවේ.

## කලත්‍ර ජීවිත ආවරණය

මෙම සැලසුම තුළින් ඔබේ කලත්‍රයාට ද ජීවිත රැකවරණයක්.

## ළමා සෞඛ්‍යාරක්ෂණ ප්‍රතිලාභය

ඔබේ දරුවාට ශ්‍රී ලංකාවේදී, ඉන්දියාවේදී හෝ සිංගප්පූරුවේදී ලැයිස්තුගත සැත්කම් 250 ක් සිදුකිරීම සඳහා මෙමගින් මූල්‍ය සහය හිමිවේ. එයට අමතරව එමගින් රෝහල්ගතවීම සඳහා මුදල්ද, වයස අවුරුදු 12 ට අඩු දරුවකු සමග දෙමව්පියන්ගෙන් අයෙකුට නැවතීමට සිදුවුවහොත් ඒ සඳහා විශේෂ දීමනාවක්ද පිරිනැමේ.

රක්ෂිතයා, රක්ෂණාවරහිමියා නොවන අවස්ථාවකදී මෙම රක්ෂණ සැලසුමේ ප්‍රතිලාභ රක්ෂණාවරහිමියාට අදාළ වන අතර, ආවරණයන් රක්ෂිතයා සඳහා අදාළ වේ. මෙම පත්‍රිකාව රක්ෂණාවරය පිළිබඳ සංක්ෂිප්තයකි. මෙම සැලසුම සම්බන්ධ සම්පූර්ණ විස්තර සඳහා කරුණාකර රක්ෂණ ඔප්පුව බලන්න.

SPG - 300000111
V5 - 06/18

# AIA සමූහය පිළිබඳ

AIA සමූහය ආසියා ශාන්තිකර කලාපයෙහි විශිෂ්ටතම ජීවිත රක්‍ෂණ සේවා සම්පාදකයා වේ.



1919
චීනය

1931
හොංකොං

1931
සිංගප්පූරුව

1938
තායිලන්තය

1947
පිලිපීනය

1948
මැලේසියාව

1957
බෲනායි

1972
ඕස්ට්‍රේලියාව

1981
නවසීලන්තය

1982
මැකාවු

1984
ඉන්දුනීසියාව

1987
කොරියාව

1990
තායිවානය

2000
වියට්නාමය

2001
ඉන්දියාව

2012
ශ්‍රී ලංකාව

2013
මියන්මාරය *

2015
කාම්බෝජය

*මියන්මාරයේ ඇත්තේ AIA නියෝජිත කාර්යාලයකි.

**US$ ට්‍රිලියන 1 කට** වැඩි සමස්ත මූලික රක්ෂිත මුදලක්

ආසියාවේ **වසර 100 කට ආසන්න** සාඩම්බර ඉතිහාසයක්

**වෙළඳපළ 18 ක මෙහෙයුම්**

**මිලියන 30 කට** අධික තනි පුද්ගල රක්ෂණාවර

**මිලියන 16 කට** අධික සමූහ සැලසුම් සාමාජිකයින්

HEALTHIER, LONGER, BETTER LIVES

**AIA ඉන්ෂුවරන්ස් ලංකා PLC**
(Co.No.PQ 18)
AIA ටවර්, 92, ධර්මපාල මාවත, කොළඹ 07
ක්ෂණික ඇමතුම්: 011 2310310
ෆැක්ස්: 011 4715892
ඊ-මේල්: lk.info@aia.com

AIA Insurance Lanka PLC (Co.No.PQ 18) විසින් නිකුත් කරන ලද: 06/2018